සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

# නර්තනය

7 ශ්‍රේණිය

කාලය පැය 2 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- සියළුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.
- අංක 01 - 05 දක්වා වූ ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

01. උඩරට නර්තන සම්ප්‍රදයේ පා සරඹ සබරගමු නර්තන සම්ප්‍රදයේ හඳුන්වනු ලබන්නේ,

(1) දොඹින පද (2) මණ්ඩිපද

(3) මාත්‍රා පද (4) ඉලංගම් පද

02. නම්‍යතා අභ්‍යාසයක් නොවන්නේ,

(1) උඩපැනීම (2) කැරකීම

(3) පිහිනීම (4) ගායනය

03. ගොඩ සරඹ, ඉලංගම් සරඹ, දොඹින පද යන අභ්‍යාස අයත් නර්තන සම්ප්‍රදායන් පිළිවෙලින්,

(1) උඩරට, පහතරට, භරත

(2) උඩරට, පහතරට, කථක්

(3) උඩරට, පහතරට, සබරගමු

(4) උඩරට, සබරගමු, පහතරට

04. ''සත්වෙත් මහත් අදර ලත් යුත් සිදත් කුමරු.....'' මෙම කවිය අයත් වන වන්නම,

(1) හනුමා වන්නම (2) වෛරොඩි වන්නම

(3) තුරඟා වන්නම (4) සිංහරාජ වන්නම

05. 2 + 3 තාල රූපයට අයත් බෙර පදයකි,

(1) දොං දොංජිං ජිං ගජිගත

(2) දොං ජිංත ගත දොංත

(3) දොං ජිජි ගත

(4) දො දොංත තකු දොං

- **ප්‍රශ්න අංක 06 - 10 දක්වා නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

  (ස්තිථික / වීර / හනුමා / කුළු / දූලඅඩිය / ලී)

06 කුද ගත ගත දොම් මෙය ........................................................................ වන්නමේ බෙර පදයයි.

07 උත්සාහ නැමති ස්ථායි භාවය තුලින් .............................................................. රසය උපදී.

08 කෘෂි කර්මාන්තය හා බැඳි ගැමි නැටුමක් ලෙස ................................................... දක්විය හැකිය.

09 එක තැන හිඳිමින් කරනු ලබන චලන .............................................. චලන නමින් හැඳින්වේ.

10 5 වෙනි පා සරඹය ..................................................................................... නමින් හැඳින්වේ.

- **අංක 11 - 15 දක්වා වූ ප්‍රශ්න වලට ''අ'' තීරුවේ ඇති පදයට ගැලපෙන පදය ''ආ'' තීරුවේ දක්වා ඇත. නිවැරදිව යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 11 | වෙස් නැටුම | මල්යහන් |
| 12 | සිව් අඩිය | සමඟුණ |
| 13 | විලම්භලය | ගොඩසරඹ |
| 14 | ගැටබෙරය | දළදපෙරහර |
| 15 | ශාන්තිකර්ම | උඩරට |

- **අංක 16 - 20 දක්වා වූ ප්‍රශ්න සඳහා පහත සඳහන් ප්‍රහේලිකාව ඇසුරු කරගනිමින් පිළිතුරු සපයන්න.**

<u>පහළට</u>

16 ''ගිරින් ගිරට පැන....'' මෙම කවිපදය අයත් වන්නමකි.

17 තාලම්පට භාවිතා කරමින් කරනු ලබන ගැමි නැටුමකි.

18 ගොඩ සරඹ අවසන් කිරීමේ පදය මෙනමින් හැඳින්වේ.

<u>හරහට</u>

19 කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ සඳහන් ඌරා ගලක් බවට පත්වූ ස්ථානය මෙනමින් හැඳින්වේ.

20 කොඩි, සේසත්, ගායන, වාදන, නර්තන ඇතුලත්ව ඇති සංස්කෘතික අංගයකි.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 16 හ 19 | | 17 තා | | 18 ක | | |
| | | | | | | |
| | | | | | | |
| | | | 20 පෙ | | | |
| | | | | | | |

**7 ශ්‍රේණිය** **නර්තනය - II කොටස**

- **පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

01 ඔබේ ගුරුතුමිය ''වැසි දිනක අසිරිය'' පිළිබඳ නර්තනයක් නිර්මාණය කිරීමට ඔබට පැවරුවේ යැයි සිතා පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) පහත වගුවේ සඳහන් වැසිදිනක දැකිය හැකි පරිසර සිදුවීම්වලට අදාළව ඔබට ප්‍රදර්ශනය කළ හැකි චලන ක්‍රියා පහත හිස්තැන්වල ලියා දක්වන්න. පහතින් උදාහරණයක් දක්වා ඇත.

| වැසි දිනක දැකිය හැකි පරිසර සිදුවීම් | ක්‍රියාකාරකම |
|---|---|
| උදාහරණ :- සුළඟ | කැරකීම |
| 1. ගස්වැල් ඇඹරීම | ............................. |
| 2. විදුලි කෙටීම | ............................. |
| 3. හෙණ හඬ | ............................. |
| 4. වතුර ගලායාම | ............................. |

(ii) වැස්ස නිර්මාණය කිරීම සඳහා යොදාගතහැකි විකල්ප වාද්‍ය උපකරණ 03 ක් හා සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ 03 ක් නම් කරන්න.

02 තාලය හා ලය පවත්වා ගැනීම නර්තනයට ගායනයට මෙන්ම බෙරවාදනයට ද අත්‍යාවශ්‍ය වූවකි.

(i) දොං ජිංත ගත දොංත බෙරපදය අදාල තිත් රූපයට ප්‍රස්තාර කරන්න.

(ii) ''ඇත සිටන් එන්නි සෙල්ලි සෙල්ලියේ
මැත සිටන් එන්නි සෙල්ලි සෙල්ලියේ''
මෙම කවිය මාත්‍රා 03 තනිතිතට ප්‍රස්තාර කරන්න.

03 වන්නම් යනු ශාන්තිකර්ම වලින් බැහැර වූ ශාස්ත්‍රීය නර්තන අංගයකි.

(i) සාම්ප්‍රදායික උඩරට වන්නම් සංඛ්‍යාව ලියා එයින් 04 ක් නම් කරන්න.

(ii) හනුමා වන්නමට අයත් කවියක් ලියන්න.

04 ගැමි ගායනා තුළින් ගැමි ජීවන රටාව මෙන්ම විනෝදාස්වාදයද ලබා දේ.

(i) පෙරහැරක දැකිය හැකි ගැමි නැටුම් 04 ක් නම් කරන්න.

(ii) ඔබ උගත් ගැමි කවියක් ලියන්න.

05 පහත සඳහන් මාතෘකා වලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) නම්‍යතා අභ්‍යාස
(ii) ගොඩසරඹ
(iii) පා සරඹ
(iv) වන්නම්

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 01 2 | 06 හනුමා | 11 දළදා පෙරහැර | 16 හනුමා |
| 02 4 | 07 වීර | 12 ගොඩසරඹ | 17 තාලම් |
| 03 3 | 08 කුළු | 13 සමගුණ | 18 කස්තිරම |
| 04 3 | 09 ස්ථිතික | 14 උඩරට | 19 හන්තාන කන්ද |
| 05 2 | 10 දෑල අඩිය | 15 මල්යහන් | 20 පෙරහැර |

## II කොටස

01 (i) 1. ස්ථිතික චලන / කඳ ඇඹරීම
2. පැනීම හා සම්බන්ධ චලන
3. ඉදගැනීම / භාව නිරූපනය
4. බිම පෙරලීම / සුරල් පෑගීම

(ii)
- ආදේශ භාණ්ඩ - ටින් බෙර, එක්ස්රේ බෙර, වල් වලල්ල, පොල් කටු
- සාම්ප්‍රදායික භාණ්ඩ - ගැටබෙරය, දවුල, පහතරට බෙරය

02 (i)

| 1 2 | / 1 2 3 | 1 2 | / 1 2 3 |
|---|---|---|---|
| දොං - | ජිං - ත | ග ත | දොං - ත |

(ල. 05)

(ii)

| / 1 2 3 | / 1 2 3 | / 1 2 3 | / 1 2 3 |
|---|---|---|---|
| ඇ - ත<br>සෙ ල් ලි<br>මැ - ත<br>සෙ ල් ලි | සි ට න්<br>යේ - -<br>සි ට න්<br>යේ - - | එ න් නි<br>- - -<br>එ න් නි<br>- - - | සෙ ල් ලි<br>- - -<br>සෙ ල් ලි<br>- - - |

(ල. 05)

03 (i) 18 කි.
1. හනුමා
2. තුරඟා
3. වෛරොඩි
4. මුසලඩි
5. ගජගා (ල. 05)

(ii) හනුමා වන්නමට අයත් කවියක් ලියා ඇත්නම්. (ල. 05)

04 (i) කළ, කුළු, ලී, තාලම් (ගැමි නැටුම් 4 කට) (ල. 04)

(ii) ගැමි කවියක් ලියා ඇත්නම් (ල. 06)

05 අදාළ මාතෘකාවට කරුණු ගොනුකර ඇත්නම් ලකුණු ලබාදෙන්න.
කරුණු පහකට ලකුණු පහයි. (5 × 2 = 10)